# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2184/18 - 2020 ජූලි මස 15 වැනි බදාදා - 2020.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

33 වැනි වගන්තිය යටතේ දැන්වීම

2020 වර්ෂයේ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2165/8 හා 2020.03.02 දිනැති, අංක 2167/12 හා 2020.03.20 දිනැති, අංක 2167/19 හා 2020.03.21 දිනැති, අංක 2172/3 හා 2020.04.20 දිනැති, අංක 2179/7 හා 2020.06.09 දිනැති හා අංක 2179/17 හා 2020.06.10 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* හා බැඳේ.

ඉහත කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2167/12 හා 2020.03.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පළමුවන ඡේදයේ සඳහන් "II. ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි, ඡන්ද විමසීම 2020 අප්‍රේල් මස 25 වැනි සෙනසුරාද පෙරවරු 7.00 සිට පස්වරු 4.00 දක්වා පවත්වනු ලබන බවත් ; 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 (i) (අ) හා (ඇ) වගන්ති යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ" යන නියමය 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 (3) වගන්තිය ප්‍රකාරව 2020 අප්‍රේල් මස 20 වැනි දින අංක 2172/3 දරන *ගැසට් නිවේදනය* මගින් එකී දිනය 2020.06.20 වැනි දින ලෙස නියම කරනු ලැබ ඇත. එකී නියමය ද 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 වන සහ 33 වන වගන්තිවල බලතල ප්‍රකාරව පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

"II. ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි, ඡන්ද විමසීම 2020 අගෝස්තු මස 05 වැනි බදාදා පෙරවරු 7.00 සිට පස්වරු 5.00 දක්වා පවත්වනු ලබන බවත් ;

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 (1) (අ), (ඇ) සහ 33 වන වගන්ති යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ."

**මහින්ද දේශප්‍රිය,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එන්. ජේ. අබේසේකර,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**එස්. රත්නජීවන් එච්. හූල්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2020 ජූලි මස 15 වැනි දින,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහ ලේකම් කාර්යාලය.
සරණ මාවත,
රාජගිරියේ දී ය.

07 - 788


1A - PG 005060 — 267 (2020/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*